# COVID -19 එන්නත් පිළිබඳ නිතර අසනු ලබන ප්‍රශ්න

**1. එන්නත්කරණය යනු කුමක්ද?**

ඔබේ ශරීරයේ ස්වභාවිකව පවතින ප්‍රතිෂක්තීකරන පද්ධතිය උපයෝගී කරගෙන ඇතිවිය හැකි හානිකර රෝග සඳහා ආරක්ෂාවක් ලබාගතහැකි සරල ආරක්ෂාකාරී කාර්යක්ෂම ක්‍රමවේදයකි. මෙහිදී ඔබගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය එක් විශේෂිත වූ රෝගයක් සඳහා ශක්තිමත් කිරීමක් සිදුවේ.

**2. COVID-19 ට එරෙහිව එන්නතක් අවශ්‍ය වන්නේ ඇයි?**

- රෝගාබාධ හා රෝග වැළැක්වීම සඳහා එන්නත් කිරීම වැදගත් වේ.
- එන්නත් ලබා දීමෙන් රෝග පාලනය හා වැළැක්වීමේ, දීර්ඝ හා ඉතා සාර්ථක ඉතිහාසයක් ශ්‍රී ලංකාවට ඇත.
- COVID -19 වැළැක්වීමේ දී සෞඛ්‍ය පුරුදු පිළිපැදීම අතිශයින්ම වැදගත් වන නමුත් එමගින් පමණක් වසංගත තත්වය පාලනය කිරීම දුෂ්කර වී ඇත.
- වසංගතය පාලනය කරගත හැකි එකම ක්‍රමවේදය ලෙස සෞඛ්‍ය පුරුදු පිළිපැදීම සහ එන්නතකරණය විය හැකිය.

**3. COVID -19 එන්නත් නිපදවීම සහ පරීක්ෂාකිරීම කරන්නේ කෙසේද?**

සෑම එන්නතක්ම රටකට හඳුන්වා දීමට පෙර එහි ආරක්ෂිත බව සහතික කිරීම සඳහා පුළුල් හා දැඩි පරීක්ෂාවකට භාජනය විය යුතුය. පර්යේෂණාත්මක එන්නතක් වෙළඳපොළට යාමට පෙර සත්ව පරීක්ෂණ, මානව පූර්ව සායනික පරීක්ෂණ සහ ජනගහන මට්ටමේ අදියර I, II සහ III සායනික අත්හදා බැලීම් සඳහා යොමු විය යුතුය. මෙම අවස්ථා වලදී එමගින් ආරක්ෂාව ලැබීමට බලාපොරොත්තු වන රෝගයට එරෙහිව ඉන් ලැබෙන ආරක්ෂාව සහ පලදායීතාවය තක්සේරු කෙරේ.

**4. COVID -19 එන්නතෙහි ඇත්තේ කුමක්ද?**

බොහෝ එන්නත් වල ප්‍රධාන වශයෙන් ප්‍රතිදේහජනක, සහායක, කල් තබා ගන්නා ද්‍රව්‍ය සහ ස්ථායීකාරක අඩංගු වේ. ඇතැම් COVID -19 එන්නත් වල ප්‍රතිදේහජනකය යනු අජීවී වෛරසයක් වන අතර එය පසු කලකදී වෛරසය ශරීර ගත වුවහොත් හඳුනාගෙන එයට එරෙහිව සටන් කිරීමට අපගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය සූදානම් කරයි.

**5. COVID -19 එන්නත ක්‍රියා කරන්නේ කෙසේද?**

මෙම එන්නතෙහි අපගේ ශරීරයේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය උපයෝගී කරගනිමින් වෛරසයට ප්‍රතිරෝධයක් ගොඩනැගීම සඳහා භාවිතා කරන වෛරසයේ අජීවී කොටසක් (වෛරසයේ මතුපිටින් සොයා ගන්නා ප්‍රෝටීනයක්) ඇත.

ශක්තිමත් ප්‍රතිශක්තීකරණ ප්‍රතිචාර සහ මතකයන් B සහ T සෛල නම් වූ විශේෂ ප්‍රතිශක්තිකරණ සෛල මගින් වර්ධනය වේ.

පසුකාලීනව පුද්ගලකුට වෛරසය ආසාදනය වුව හොත්, මෙම සෛල වෛරසය මතක තබා එයට පහර දෙමින් පුද්ගලයා COVID-19 රෝගයෙන් ආරක්ෂා කරයි.

## 6. COVID -19 එන්නත ලබා ගැනීම වැදගත් වන්නේ ඇයි?

• කොවිඩ් -19;

- පහසුවෙන් කෙනෙකුට වැලදිය හැකි අතර පුද්ගලයින් අතර ඉක්මනින් පැතිරෙයි
- එයට බරපතල රෝගාබාධ, රෝහල් ගතවීම්, දිගු කාලීන සංකූලතා සහ මරණය පවා ඇති කළ හැකිය

ඔබ එන්නත ලබා ගැනීම මගින් ඔබේ ආරක්ෂාවද, ඔබේ පවුල සහ ඔබ අවට සිටින අයගේ ආරක්ෂාවද වැඩිවීමේ හැකියාව වැඩිවේ.

හොඳ සෞඛ්‍ය තත්වයක සිටීම COVID -19 නොවලදීමට හෝ එය තවත් අයෙකුට බෝ කිරීමට ඇති අවදානම අඩු නොකරයි.

ඔබට වෛරසය ආසාදනය වී ඇති නමුත් කිසිදු රෝග ලක්ෂණයක් නොපෙන්වා සිටින අවස්ථාවකදී ඔබගේ ආදරණීයයන්ට සහ ඔබ අවට සිටින අයට ඔබ නොදැනුවත්වම වෛරසය පැතිරිය හැකියි.

එමනිසා එන්නත ලබා ගැනීමෙන් අපත්, අප සමාජයත් ආරක්ෂා කිරීමට දායක වන අතර එය සමාජ වගකීම ඉටු කිරීමක් ද වේ.

## 7. COVID -19 එන්නත ආරක්ෂිතද?

අනෙකුත් සියලුම එන්නත් මෙන්ම, COVID -19 එන්නත සඳහා ද එහි ආරක්ෂිත බව සහ පලදායීතාවය සඳහා වන දැඩි නිර්ණායක සපුරාලිය යුතුය. සියළුම එන්නත් භාවිතය සඳහා අනුමත වීමට පෙර ඒවා ආරක්ෂිත බව සහතික කිරීම සඳහා දැඩි අධ්‍යයනයන්ට යොමු වේ.

COVID-19 ගෝලීය සෞඛ්‍ය හදිසි අවස්ථාවක් බවට පත්වීමත් සමඟ ලොව පුරා විද්‍යායින් හැකි ඉක්මනින් එන්නත් ලබා ගැනීමට දැඩි වෙහෙසක් දැරීය.

එන්නත් නිපදවීමේ ක්‍රියාවලියේ දී වැදගත්ම සාධකයක් ලෙස සලකන ලද්දේ එන්නතේ ආරක්ෂාවයි (vaccine safety).

ඉතා වේගයෙන් විවිධ එන්නත් වර්ග ඇගයීම සිදු කරන ලදී.

කෙටි මාර්ග අනුගමනය කර නැත.

නිසි සායනික අත්හදා බැලීම් කර ඇත.

• මේ අනුව විශාල කැපවීමක්, ප්‍රමාණවත් අරමුදල් සහ පොදු ඉලක්කයක් සපුරා ගැනීම සඳහා ක්‍රියා කරන ලද දක්ෂ පුද්ගලයින් කණ්ඩායමකගේ උත්සාහයක ප්‍රතිපලයක් ලෙස මෙම එන්නත් දැක්විය හැකිය.

**8. COVID -19 එන්නතෙන් ඇති විය හැකි අතුරු ආබාධ මොනවාද?**

භාවිතයේ ඇති අනෙකුත් සියලුම එන්නත් මෙන්ම COVID-19 එන්නතා මගින්ද අතුරු ආබාධ ඇති විය හැකිය. ඒවා එය එන්නත් කරන ස්ථානයේ වේදනාව, මෘදු උණ, මාංශ පේශි වේදනාව, හිසරදය සහ සමහර විට සෙම්ප්‍රතිශ්‍යාව වැනි සුළු හා තාවකාලික අතුරු ආබාධ විය හැකිය. වඩාත් බරපතල අතුරු ආබාධ ඇතිවිය හැකි නමුත් ඒවා විරලය.

**9. ඔබ COVID 19 එන්නත ලබා ගැනීමට පෙර ඔබේ සෞඛ්‍ය කාර්යමණ්ඩලයට දැනුම් දිය යුතු තොරතුරු මොනවාද?**

ඔබගේ සියලුම සෞඛ්‍ය තත්වයන් පිලිබඳව තොරතුරු අදාළ සෞඛ්‍ය කාර්යමණ්ඩලයට දැනුම් දෙන්න. පහත කරුණු සඳහා ද අවධානය යොමු කරන්න.

- ඔබට කවදා හෝ කිසියම් ඖෂධයක්, එන්නතක් හෝ එන්නතක කිසියම් සංඝටකයක් ගැනීමෙන් පසු දරුණු අසාත්මිකතා (anaphylaxis) ඇති වී තිබේ නම්
- ඔබට උණ ඇත්නම්
- ඔබට රුධිරය කැටි ගැසීමේ ගැටළුවක් ඇතිනම්
- ඔබ ප්‍රතිශක්තිය දුර්වල නම් හෝ ඔබේ ප්‍රතිශක්තිකරණ පද්ධතියට බලපාන ඖෂධයක් ලබා ගන්නේ නම්
- ඔබ ගර්භණී නම්
- ඔබ මව්කිරි දෙනවා නම්
- ඔබට වෙනත් COVID-19 එන්නතක් ලැබී ඇත්නම්

**10. COVID-19 එන්නත සඳහා සුදුසුකම් නොලබන්නේ කවුද?**

- ගර්භනී මව්වරුන්
- මව්කිරි දෙන මව්වරුන්
- වයස අවුරුදු 18 ට අඩු අය
- එන්නත සඳහා කලින් අසාත්මිකතා ඇති අය (එවැනි පුද්ගලයින්ට එන්නත් කිරීම සම්බන්ධයෙන් වෛද්‍ය උපදෙස් ලබා ගත යුතුය)
- එන්නතෙහි ඕනෑම සංරචකයකට ආසාත්මිකතා ඇති අය
- වෙනත් ඖෂධ නිෂ්පාදන හෝ ආහාර ද්‍රව්‍ය වලට දැඩි ආසාත්මිකතා / anaphylaxis (රෝහල් ගත කිරීම අවශ්‍ය වේ)
- ආසාත්මිකතා ඉතිහාසයක් ඇත්නම්, වෛද්‍ය ප්‍රතිකාර යටතේ රෝහලක එන්නත් කිරීම වඩා හොඳය

**11. මට COVID-19 එන්නතක් ලැබෙන තුරු COVID-19න් ආරක්ෂා වීමට කල යුත්තේ කුමක්ද?**

- ඔබත් අනෙක් අයත් ආරක්ෂා කර ගැනීම සඳහා, මෙම නිර්දේශ අනුගමනය කරන්න.
- ඔබේ නාසය සහ මුඛය වැසෙන සේ මුව ආවරණයක් පළඳින්න
- සැම විටම අවම වශයෙන් මීටර් 1 ක පරතරයක් අන් අය සමග පවත්වා ගන්න
- සෙනග බහුලව සිටින ස්ථාන වලට නොයන්න
- නිසි ලෙස වාතාශ්‍රය නොලැබෙන ස්ථාන හැකි සැම විටම මග හරින්න
- ඔබේ දැත් නිතර නිසි ලෙස පිරිසිදු කරන්න

**12. COVID-19 එන්නත ගැන මට තවත් ප්‍රශ්න තිබේ. විශ්වාසදායක තොරතුරු ලබා ගන්නේ කෙසේද?**

එන්නත් පිළිබඳ තොරතුරු අන්තර්ජාලය හරහා සොයා බලන විට, සැම විටම විශ්වාසදායක ප්‍රභවයන් පමණක් භාවිත කරන්න. මේ සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), වසංගත රෝග විද්‍යා අංශය- ශ්‍රී ලංකාව, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය ආදියෙහි වෙබ් අඩවි භාවිතා කිරීම හෝ වැඩිදුර සෞඛ්‍ය තොරතුරු සඳහා 1999 "සුව සැරිය" අමතන්න